# LEASE

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# කල්බද්ද

කල්බද්දක් යනු එකඟ වූ යම්කිසි කාලපරිච්ඡේදයක් සඳහා වත්කමක් භාවිත කිරීමේ අයිතිය යම් ගෙවීමක් හෝ ගෙවීම් මාලාවක් මත බදු දීමනාකරු විසින් බදු ගැනුම්කරු වෙත පවරා දෙනු ලබන ගිවිසුමකි.

# කල්බද්දක පාර්ශවකරුවන්

- ගැනුම්කරු
- විකුණුම්කරු

# කල්බදු ක්‍රමයට ලබාගත හැකි දේපළ

- ඉඩම්
- ගොඩනැගිලි
- යන්ත්‍ර
- මෝටර් රථ
- උපකරණ. වැනි දේ

ClassWork.LK

# කල්බදු අයිතිය ඇති වත්කම් හා පවතින අවදානම් හා ප්‍රතිලාභ

| අවදානම් | ප්‍රතිලාභ |
|---|---|
| ▪ අක්‍රිය ධාරිතාවන්<br>▪ තාක්ෂණික යල්පැනීම<br>▪ නඩත්තු කිරීම හා අලුත්වැඩියාව | ▪ ආර්ථික ප්‍රතිලාභ ජනනය<br>▪ වත්කමේ අගය ඉහළ යෑම<br>▪ වත්කම අපහරණයෙන් ලැබෙන ප්‍රාග්ධන ලාභ |

ClassWork.LK

# ගැනුම්කරුගේ පොත්වල ගිණුම් තැබීම

- **කල්බදු අයිතිය ඇති වත්කමේ සාධාරණ අගය හෝ අවම කල්බදු ගෙවීම්වල වර්තමාන අගය යන දෙකෙන් අඩු අගය.**

| | | |
|---|---|---|
| අදාළ වත්කම් ගිණුම | හර | x x x |
| කල්බදු ණයහිමි ගිණුම | බැර | x x x |

- **වත්කම ගන්නා අවස්ථාවේ ගෙවන මූලික ගෙවීම් / මූලික තැන්පතුව**

| | | |
|---|---|---|
| කල්බදු ණයහිමි ගිණුම | හර | x x x |
| මුදල් ගිණුම | බැර | x x x |

- **වසර අවසානයේ කල්බදු පොලිය ගැළපීම**

| | | |
|---|---|---|
| කල්බදු පොලී ගිණුම | හර | x x x |
| කල්බදු ණයහිමි ගිණුම | බැර | x x x |

ClassWork.LK

# කල්බදු පොලිය දී නැති විට කල්බදු පොලිය සෙවීම

(දී ඇති ප්‍රතිශතය අනුව පොලිය ගණනය කළ යුතුය)

- **වාරික ගෙවන විට**

| | | | | |
|---|---|---|---|---|
| කල්බදු ණය හිමි ගිණුම | හර | xxx | | |
| මුදල් ගිණුම | | | බැර | xxx |

- **වත්කමේ වාර්ෂික ක්ෂය ගැළපීම**

| | | | | |
|---|---|---|---|---|
| අදාළ ක්ෂය ගිණුම | හර | xx | | |
| අදාළ ක්ෂය වෙන්කිරීමේ ගිණුම | | | බැර | xx |

ClassWork.LK

වත්කමේ අයිතිය බදු කාලය අවසානයේ ගැනුම්කරුට ලැබේ නම් වත්කමේ වාර්ෂික ක්ෂය ප්‍රමාණය,

$$= \frac{\text{වත්කමේ සාධාරණ අගය} - \text{අවශේෂ අගය}}{\text{වත්කමේ ඵලදායී ජීව කාලය}}$$

වත්කමේ අයිතිය බදු කාලය අවසානයේ ගැනුම්කරුට නොලැබේ නම් වත්කමේ වාර්ෂික ක්ෂය ප්‍රමාණය,

$$= \frac{\text{වත්කමේ සාධාරණ අගය} - \text{අවශේෂ අගය}}{\text{බදු කාලය}}$$

ClassWork.LK

# වසර අග මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කල්බදු ණයහිමියෝ දැක්වීම

**ජංගම වගකීම්**

| | |
|---|---|
| වාර්ෂිකව ගෙවිය යුතු වාරිකය | xx |
| ඊළඟ/ඉදිරි වසරේ කල්බදු පොලිය | (x) |
| කල්බදු ණයවල ජංගම කොටස | xx |

**ජංගම නොවන වගකීම්**

| | |
|---|---|
| වසර අග කල්බදු ණයහිමි ශේෂය | xxx |
| කල්බදු ණයවල ජංගම කොටස | (xx) |
| කල්බදු ණය හිමියෝ | xxx |

ClassWork.LK

# අභ්‍යාස - 01

1) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුව කල්බදු නිර්වචනය කරන්න.

2) කල්බදු, කල්බදු ගැනුම්කරුගේ පොත්වල වාර්තා කරන ආකාරය දක්වන්න.

3) කල්බදු පොලිය වාර්තා කරන ආකාරය ජ'නල් සටහන් මගින් දක්වන්න.

4) කල්බදු ණයහිමි ශේෂ ජංගම හා ජංගම නොවන වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරන ආකාරය ලියා දක්වන්න.

ClassWork.LK

# අභ්‍යාස - 02

සීමිත අමන්දා පොදු සමාගම 2022.04.01 දින කල්බද්දක් මත යන්ත්‍රයක් අත්පත් කර ගන්නා ලදී. මෙම ගනුදෙනුවට අදාළ පහත තොරතුරු ලබා දී ඇත.

- යන්ත්‍රයේ සාධාරණ අගය - රු. 1 541 992
- මූලික ගෙවීම - රු. 400 000
- සෑම වසරක් අගම ගෙවිය යුතු කල්බදු වාරිකය - රු. 400 000
- කල්බදු කාලය වසර - 4 යි
- යන්ත්‍රයේ අවශේෂ අගය - රු.41 992
- ඵලදායී ජීවකාලය - වසර 5 යි
- කල්බදු පොලී අනුපාතය වසරකට - 15%

කල්බදු කාලය අවසානයේ යන්ත්‍රයේ අයිතිය සීමිත අමන්දා පොදු සමාගමට ලැබේ.

ClassWork.LK

එක් එක් වසර අවසානයේ කල්බදු පොලිය පහත දැක්වේ.

| වසර | | කල්බදු පොලිය රු. |
|---|---|---|
| 2022/2023 | - | 171 289 |
| 2023/2024 | - | 136 994 |
| 2024/2025 | - | 97 542 |
| 2025/2026 | - | 52 174 |
| මුළු පොලිය | - | 457 999 |

**අවශ්‍යවන්නේ,**

1) 2023.03.31න් අවසන් පළමු වසර සඳහා වාර්ෂික ක්ෂය ගිණුම් තැබීම ද ඇතුළුව අදාළ ජර්නල් සටහන්

2) 2023.03.31න් අවසන් වන පළමු වසර සඳහා වාර්ෂික ක්ෂය ගිණුම් තැබීම ද ඇතුළුව අදාළ ලෙජර් ගිණුම්

3) 2023.03.31න් අවසන් වසරට අදාළ ව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු කල්බදු දේපළට අදාළ අයිතමයන්

ClassWork.LK

## අභ්‍යාසය - 03

සීමිත බංඩාර සමාගම 2021.04.01 දින කල්බදු ක්‍රමයට මෝටර් රථයක් මිල දී ගත්තේය. ඒ සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

- මෝටර් රථයේ සාධාරණ අගය රු. 230 000
- කල්බදු කාලය වසර 05
- මූලික තැන්පතුවක් නැත
- වාරිකයක වටිනාකම රු. 606 800

  (සෑම ගිණුම් වසරක් අවසානයේ ම ගෙවිය යුතු ය)
- පොලී අනුපාතය වසරකට 10% කි
- මොටර් රථයේ ජීව කාලය වසර 05යි. සුන්බුන් අගය රු. 300 000යි.

ClassWork.LK

**අවශ්‍ය වන්නේ,**

1) සීමිත බංඩාර සමාගමේ ඉහත ගනුදෙනු 2022.03.31න් අවසන් වසරට අදාළව ජර්නල් සටහන් මඟින් දක්වන්න.

2) සීමිත බංඩාර සමාගමේ ඉහත ගනුදෙනු 2022.03.31න් අවසන් වසරට අදාළව ලෙජර් ගිණුම් මඟින් දක්වන්න.

3) සීමිත බංඩාර සමාගම 2022.03.31න් අවසන් වසරට අදාළව මූල්‍ය ප්‍රකාශන උද්ධෘත දක්වන්න.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura